යම් ප්‍රවෘත්තියකට සෘජුව අදාළ නොවන අවස්ථාවන්හිදී කාන්තාවන්ගේ බාහිර ස්වරූපය ඉස්මතු කොට දැක්වීම ඇතැම් විටකදී මුද්‍රිත මාධ්‍ය තුළ දක්නට ලැබෙන ගැටළුවකි. "රූමත්" වැනි විශේෂණ යෙදුම් උපයෝගී කරගනිමින් කාන්තාවන්ව හැඳින්වීමත්, භාවාතිෂය ආකාරයේ සඳහන් කිරීම් ඔස්සේ කාන්තා බාහිර ස්වරූපය ඉස්මතු කර දැක්වීමත් ඊට උදාහරණ වේ.

මෙහි එක් ගැටළුවක් වන්නේ, කාන්තාවන්ව හැඳින්වීම සඳහා ඔවුන්ගේ බාහිර ස්වරූපය යොදාගැනුනත්, පුරුෂයින්ගේ බාහිර ස්වරූපය හරහා ඔවුන්ව හැඳින්වීමක් දක්නට ලැබෙන්නේ අතිශයින්ම කලාතුරකින් වීමයි. එසේ නම් එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමක් සහ, එසේ බලන විට ආචාර ධර්ම විරෝධී මාධ්‍යකරණයක් නොවේදැයි අප විමසිය යුතුයි.

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #SundayDivaina #Mawbima**